## මරණය සෙවණැල්ලක් වී මා වටා පැදකුණු කරයි

මරණය සෙවණැල්ලක් වී
මා වටා පැදකුණු කරයි
කළු දත් විලිස්සා
මට සරදම් කරයි

නොලියු කවි පද
තණ අග පිනි වෙත
නොලැබු සෙනෙහස
කාන්දු වෙයි
හිල් වූ ජීවිත බඳුනෙන්

වියැකී යන දෙනෙතින් දකිමි මම
ජීවිතයේ බොඳ වූ සිහිනය
මරණය සෙවණැල්ලක් වී
මා වටා පැදකුණු කරයි

අවසාන පැය රැගෙන මරණය එයි
පැරණි ණයකරුවකු සේ
දිවියේ නිති දහම ඔබයි
සුගත් හිමි දහම් මනසේ වපුරමින්
මම නොසැලෙමි
පිදුරුතලාගල කන්ද ලෙසින්

මරණය සෙවණැල්ලක් වී
කළු දත් විලිස්සා
මා අඹා එද්දී
මම නොසැලෙමි
පිදුරුතලාගල කන්ද ලෙසින්

**සුනිල් ගෝවින්න**



## අනේ හනුමා !!!

හොර රහසෙම ඇවිත් මහ රෑ අඹ ගහට
වැළ වරකා ද කා හපකර දා බිමට
නුඹ තනිකර දමා පැනගිය මිතු කැලට
නැත කිසි සමා, හනුමා නොතලමි නුඹට

පොඩිවුන් දඟයි බැටදෙයි කැට මුගුරු වලින්
හොරැ හින් බලාපන් තුරු අතුපතර තුළින්
හඬ නොම තලා සැනහෙන් රෑ ගිල්ල පලින්
ගැල වී යනු නොහේ අද රෑ වෙන්ට කලින්

බඩ බැඳ පැටව් හිඟමන් ඉල්ලනු වාගේ
ගෙන් ගෙට ඇවිද යන්නද නුඹලා කාගේ
වන අඩවියේ පිරි රස පල නුඹලාගේ
අහිමිව ගියේ වරදෙනි රුදු මිනිසාගේ

ඔන්චිලි පැද්ද රඟ අතුවල එල්ලීලා
රංචුව එක්ක චකු-බුකු ගා නැටු ලීලා
හැට පිරුණු-මුත් විසුවේ ඉහළට වීලා
අබිමන අහෝ! මිනිසාහට දන් දීලා

**පද්මසිරි හේරත්**
වෙරිබි වික්ටෝරියා

## සහනය ලැබුණා මතකයි

අඳුරු ලොවක් සැදුවා මතකයි
අඳුරු ලොවින් මිදුණා මතකයි

මෘදු සුමුදු බොළඳ වදන් කීවා මතකයි
රළු සැඩ සමච්චල් වදන් කීවා මතකයි

මගෙ දිවියේ ආලෝකයෙන් මා
අඳුරු ලොවට ඇද වැටුණා මතකයි
අඳුරු ලොවක් සැදුවා මතකයි
අඳුරු ලොවින් මිදුණා මතකයි

රණ් මුදුව පැළඳි ඇඟිල්ලෙන්
ගිලිහී ගියා මතකයි
සිතට තිබුණ තැවුල් නිවී
සහනය ලැබුණා මතකයි

අඳුරු ලොවක් සැදුවා මතකයි
අඳුරු ලොවින් මිදුණා මතකයි
අඳුරු ලොවක් සැදුවා මතකයි

**ශ්‍රියානි ගෘල්**
- ජර්මනිය

*අන්තර්ජාලයේ සාහිත්‍ය කවුළුව*
***www.ketapathpawra.com***

## මවුනි

හිඳිනා විටදි ඔබ ළඟ මම කුඩා කල
දැණුනා මවුනි ඔබෙ සෙනෙහස පුරාවට
ඔබෙන් වෙන්ව මා තනියම සිටින අද
වාවනු බැරි ය ඔබ සිහි වන මගේ හද

පුතේ පුතේ කියමින් ඔබ ඒ කාලේ
සිටියා මගේ පසුපස සෙවනැල්ලක් වාගේ
හෙළනෙමි කඳුළු ඔබ සිහිවන හැම වාරේ
හීනෙන්වත් ඇවිත් මා ළඟ ඉනු අම්මේ

සඳ දුටුවම ඔව සිහිවේ හැමදාම
මව් නැති ලොවක් නොපතමි මා කිසිදාක
පුතේ කියා මා ඔබ තුරුළට අරන් මම
දෙනු මැන මව් සුවය අම්මේ අනේ මට!

**අචලා දිසානායක**
මෙල්බර්න්

## කනේරු ගහ කියූ කවිය



මාර දෙල් කොස්
වනස්පති කුලේ
ගස් යට
හිග පාඩු පුරන
හ.න ලදු කැලෑ
කුලයේ උපන්නෙමු
ගෙවතු පිලිකනු
දෙවැටි බඩවැටි
රිසිවේසම් ඉඩම් වල
අනේ අනවසරයෙන්
සරන්නෙමු
මල් උයන් වතු සරන
උයන් පල් සෙනෙහස
නොවිඳම
අපි අපේ දිවිමග සරි
කරන්නෙමු
මෙහෙව් අඩුපාඩු
මදිවට
තොපේ වස කමින්
අනේ අප ලබැදියන්
මැරෙතැයි
නොයෙක අවලාද
නැගෙතැයි
අඬෝවැඩියා නොනගා
අපිත් අපිට හැකි පමණ
සොදුරු මල් උපද්දා
උදය සරසවන්නෙමු
සෙවණ පල වැලද දන් ද.
කැදලි හදන්නත් ඉඩ ද.
සකුන ගන පමනක්ම නොව
වෙනත් ක්ෂුද්‍ර ගන සමග අප
සාර සුබාවට දිවි ගෙවන්නේ

ඉතින් මිනිසුනේ දැන්වත්
අනේ අපේ දිවිය තිත්තයි
තවත් ඉවසනුය බෑ සත්තයි
කියා විෂ වලදන්නට පෙර
අපම කමටහනට ගෙන
දිරි ගනින් පලා නොයන්න
දුකත් නැතිව බැරි
මේ සොදුරු ජ.විතෙන්

**සුසන්ත ජානක**



## කඳුළක අගය

පෙම් බැඳි කාලෙදි
නා ගස් සෙවනෙදි
සදා පෙම ඔබයි
දුන්න පොරොන්දුව

පයට පාගලා
ඔබහට පිටුපා
මංගල පෝරුවේ
මුදු පළදද්දී

මගේ අලුත් පෙම
ගැහැණු කඳුළු වල
අගය නොදත් බව
දැන නොසිටියෙමි

**ලක්ෂ්මී ගුණරත්න**



## . . අන්තිම ට

මේ අවසන් කවිය ද
නො කියවන්න
කවි ලියන මා සුමිතුර

ණයට ගත්තද අපි
ඔය බර ගිනි අවි
උඩින් අත අරින විට
හිතුවක්කාරෙ ට
නැහුනෙ ගස් ගල් විතරද

තුරු තුඩින් මිදුණ
දල්ලක සියුම් රිදුමට
මට දුක හිතවන්න තරමට
කවි ලියු උඹට
මේ අහිංසකයින් ගෙ මරණ
නොදැනුනේ කොහොමද

ගල් බෝතලයක
හිත් පොඟවගෙන
ගල් බැම්මෙ ඉඳන් වින්ද
ඉස්සර ලිව්ව උඹෙ කවි
උතුරට දකුණ යා කරන
නොදන්නව වගෙ
ආයෙම අලුතින් ලියනවිට
අනේ දැං කොච්චර ලාබද

උන්ගෙ යුද්ධය
උන්ගෙ සාමය
උඹයි මට කියා දුන්නේ ඇන ඇන
උන්ගෙ යුද්ධයේ
උඹයි දැං පළවෙනි ගොදුර
එකම කවියක් වත් නොලියුව
මා ළතෙත් කිවියර

**මහේෂ් මුණසිංහ**

# පහන් වැට

සංස්කරණය
තුෂාරි ප්‍රියංගිකා

## අම්මේ ඔබෙන් සමුගත් දා....

වියපත් ඔබෙ දුක්බර වත
දෙස බලා ඉන්න බෑ..
සෝබර නෙත කඳුළු වලින්
තෙත් කරනව බලන්න බෑ..

මා හිස සිඹ තුරුලට ගෙන
කියූ වදන් දරන්න බෑ..
දෙපා නැමද සමුගෙන
ඔබ තනිකර යන්නත් බෑ..

සැරයටියට වාරු ඇතිව
දොර කඩ ළඟ ඉන්නා ඔබ
මැව් මැව් පෙනෙනා විට
දැනෙනා දුක කියන්න බෑ..

ඔබ සැම ගෙන් සමු ගෙන මා
උඩු ගුවනේ තනි උනාම
හිතට දැනෙන ඒ දුක නම්
කියලා නිම කරන්නම බෑ..

**යසා හෙනබර්ග්**
ජර්මනිය

## යතාර්ථවාදියකුගේ සිතුවිලි

වාරු නොමැති ගත නොසලා
මරණ භයෙන් සලිත වෙලා
පසු භවයක සැපත බලා
සිත් සනසති එකතු වෙලා

යලි උපදී යයි නොසිතමි
මරණ බියෙන් සිත නොතලමි
මේ භවයෙදි නොලද සැපත
යළි නොපතා සැනසෙන්නෙමි.

අනාගතයෙ පරපුරකට
ඉඩ සලසා නික්මීමට
ළඟ එන මරණය සැපතකි
මහලු ගතට සෙවණැල්ලකි.

සක්වල ගල ඉස්මත්තේ
නන්නාඳුන අඳුරු ලොවක
සෙනෙහසෙ පහනක් දැල්වේ
වාරු නැතත් ලං වීමට

පහන නිවී අඳුර ගලා
ගත සිත මැලවුණ දිනයක
මරණය ඉක්මන් කරවිත්
වැළඳ ගනින් මා තනිකර.

**විජයසිරි තිලකුමාර**
බ්‍රිස්බේන්

